සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved.



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# ලංකා ඉතිහාසය - I

**13 ශ්‍රේණිය** | **කාලය පැය 01 යි.**

උපදෙස්:

- **මෙම කොටස ප්‍රශ්න 40 කින් සමන්විත වේ. සියලුම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.**
- **එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර 05 බැගින් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ එකක් පමණි. මේ නිවැරදි පිළිතුර තෝරා දී ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.**
- **මෙම කොටසට ලකුණු 40 ක් දෙනු ලැබේ.**
- **කොටස් දෙකටම මුළු කාලය පැය තුනකි. පිළිතුරු ලියා අවසන් වූ පසු I කොටස II කොටසේ පිළිතුරු පත්**

---

- **අංක 01 - 05 තෙක් වූ එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතරින් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ නොගැළපේ. එම නොගැළපෙන නම කුමක්දැයි හඳුනාගෙන එහි අංකය වරහන් තුළ ලියන්න.**

01. (1) අඹගමුව සෙල්ලිපිය (2) දඹුල්ල පර්වත ලිපිය (3) රඹෑව පුවරු ලිපිය
(4) රත්කොත් විහාර සෙල්ලිපිය (5) වාදුරුප්ප සෙල්ලිපිය (........)

02. (1) අනුරාධ ගාම (2) උපතිස්ස ගාම (3) උරුවෙල ගාම
(4) උද්දේනි ගාම (5) විජිත ගාම (........)

03. (1) නිශ්ශංක මල්ල (2) චෝඩ ගංග (3) සහස්ස මල්ල
(4) දෙවන වික්‍රමබාහු (5) පළමුවන ජයබාහු (........)

04. (1) දන්තුරේ සටන (2) වෙල්ලස්ස සටන (3) බලන සටන
(4) රන්දෙනිවල සටන (5) ගන්නොරුව සටන (........)

05. (1) ඉට්ඨිය (2) උත්තිය (3) භද්දසාල
(4) මහානාම (5) සම්බල (........)

- **අංක 06 - 10 තෙක් වූ ප්‍රශ්නවල පද යුගල 05 බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක් යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගලය කුමක්දැයි හඳුනාගෙන ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන් තුළ ලියන්න.**

06.
(1) පිතු මහ රජ — වළගම්බා රජතුමා
(2) මේඝවණ්ණාභය — ගෝඨාභය රජතුමා
(3) කාලිංග විජයබාහු — මාඝ
(4) ෂඩ්භාෂා පරමේශ්වර — හයවන පරාක්‍රමබාහු රජතුමා
(5) ටිකිරි කුමාරයා — පළමුවන රාජසිංහ රජතුමා (........)

07.
(1) දැදුරු ඔය — යෝධ වැව
(2) මල්වතු ඔය — නාච්චදූව වැව
(3) කලා ඔය — කලා වැව
(4) යාන් ඔය — හුරුළු වැව
(5) කනකරායන් ආරු — ඉරණමඩු වැව (........)

08. (1) මෞර්ය පෙළපත ධාතුසේන රජතුමා
(2) ලම්භකර්ණ පෙළපත වසභ රජතුමා
(3) කාලිංග පෙළපත පළමුවන විජයබාහු රජතුමා
(4) දඹදෙනි පෙළපත තුන්වන විජයබාහු රජතුමා
(5) නායක්කාර් පෙළපත ශ්‍රී විජය රාජසිංහ රජතුමා (........)

09. (1) සෙනවිරද් සේනාපති (2) මහලේනා මහලේකම්
(3) අධිකාරි මුදල් ලේකම් (4) සිරිත් ලේනා නීතිය පිළිබඳ ලේකම්
(5) දහම් පසන්න පූජ්‍ය කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ (........)

10. (1) දේවානම් පියතිස්ස රජු සංඝමිත්තා තෙරණිය
(2) මහාසේන රජු සංඝමිත්ත ථෙර
(3) සිරිමේඝවන්න රජු හේමමාලා හා දන්ත කුමරු
(4) පළමුවන උපතිස්ස රජු බුද්ධඝෝෂ ථෙර
(5) මහානාම රජු පාහියන් ථෙර (........)

- **අංක 11 සිට 15 තෙක් වූ එක් එක් ප්‍රශ්නය සඳහා නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් X සහ Y තීරුවල දී ඇත. Y තීරුවේ දක්වා ඇති නාම / ප්‍රකාශන / දින වකවානු X තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකින් ගැලපේ. එහෙත් ඒවා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙලට නොවේ. Y තීරුව X තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙලට සකස් කළ විට පහත දී ඇති සංයෝග පහෙන් එකක් නිවැරදිය. නිවැරදි සංයෝගයට අයත් අංකය තෝරා ඉදිරියේ ඇති තිත් ඉරමත ලියන්න.**

11.

| | X | | Y |
|---|---|---|---|
| (i) | ටැන්කට් අමුණ | A | දුදුරු ඔය |
| (ii) | හත්තොට අමුණ | B | වලවේ ගඟ |
| (iii) | ඇළහැර අමුණ | C | මහවැලි ගඟ |
| (iv) | මිණිපේ අමුණ | D | කළු ගඟ |
| (v) | කොට්ඨබද්ද අමුණ | E | අඹන් ගඟ |

(1) BEDCA (2) BDECA (3) BACED (4) BCAED (5) BDACE (........)

12.

| | X | | Y |
|---|---|---|---|
| (i) | රාජ රාජ | A | චීන |
| (ii) | මාඝ | B | චෝළ |
| (iii) | චන්ද්‍රභානු | C | ජාවක |
| (iv) | ජටාවර්මන් | D | කාලිංග |
| (v) | චෙං හෝ | E | පාණ්ඩ්‍ය |

(1) BCADE (2) BADEC (3) BECAD (4) BDCEA (5) BCEAD (........)

13.

| | X | | Y |
|---|---|---|---|
| (i) | තම්බපණ්ණි | A | මෝදරගම් ආරු |
| (ii) | මගන | B | අරුවි ආරු |
| (iii) | උරුවේල | C | කදම්බ නදී |
| (iv) | උපතිස්සගාම | D | කල්‍යාණි නදී |
| (v) | කල්‍යාණි | E | කලා ඔය |

(1) BECDA (2) BAECD (3) BDCEA (4) BACED (5) BCDAE (........)

14. X | Y

(i) රුවන්වැලි සෑ පුවරු ලිපිය — A පළමුවන විජයබාහු රජු

(ii) ගල්පොත ලිපිය — B කල්‍යාණවතී රැජින

(iii) දැදිගම පුවරු ලිපිය — C දෙවන පරාක්‍රමබාහු රජු

(iv) දඹදෙණි කතිකාවත — D නිශ්ශංකමල්ල රජු

(v) පනාකඩුව තඹ සන්නස — E භයවන බුවනෙකබාහු රජු

(1) BADCE (2) BDCAE (3) BDECA (4) BCEDA (5) BEDCA (........)

15. X | Y

(i) ජී. ජී. පොන්නම්බලම් — A සිංහල මහ සභාව

(ii) ඩී. එස්. සේනානායක — B දෙමළ කොන්ග්‍රසය

(iii) එන්. එම්. පෙරේරා — C ලංකා සමසමාජ පක්ෂය

(iv) සී. ඩබ්ලිව්. ඩබ්ලිව් කන්නන්ගර — D ජනපද ව්‍යාපාර

(v) එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක — E නිදහස් අධ්‍යාපනය

(1) BDCEA (2) BCDEA (3) BCADE (4) BEACD (5) BADEC (........)

- **අංක 16 සිට 20 තෙක් වූ එක් එක් ප්‍රශ්නයට ගැළපෙන පිළිතුර තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන් තුළ ලියන්න.**

16. ශ්‍රී ලංකාවේ අග නගරවල නිවැරදි අනු පිළිවෙල අඩංගු වන්නේ පහත සඳහන් කවර වරණයේ ද?
    (1) පොළොන්නරුව, දඹදෙණිය, කුරුණෑගල, යාපහුව, ගම්පොළ.
    (2) පොළොන්නරුව, දඹදෙණිය, ගම්පොළ, කුරුණෑගල, යාපහුව.
    (3) පොළොන්නරුව, දඹදෙණිය, යාපහුව, කුරුණෑගල, ගම්පොළ.
    (4) පොළොන්නරුව, යාපහුව, කුරුණෑගල, දඹදෙණිය, ගම්පොළ.
    (5) පොළොන්නරුව, කුරුණෑගල, දඹදෙණිය, යාපහුව, ගම්පොළ. (........)

17. අනුරපුර රජවරුන්ගේ නිවැරදි අනුපිළිවෙළ අඩංගු වන්නේ පහත සඳහන් කවර වරණයේද?
    (1) සද්ධාතිස්ස, ථූලත්ථන, බල්ලාටනාග, ලඤ්ජතිස්ස, වට්ටගාමිණී අභය
    (2) සද්ධාතිස්ස, බල්ලාටනාග, ථූලත්ථන, ලඤ්ජතිස්ස, වට්ටගාමිණී අභය
    (3) සද්ධාතිස්ස, ථූලත්ථන, බල්ලාටනාග, වට්ටගාමිණී අභය, ලඤ්ජතිස්ස
    (4) සද්ධාතිස්ස, වට්ටගාමිණී අභය, බල්ලාටනාග, ථූලත්ථන, ලඤ්ජතිස්ස
    (5) සද්ධාතිස්ස, ථූලත්ථන ලඤ්ජතිස්ස, බල්ලාටනාග, වට්ටගාමිණී අභය (........)

18. අනුරාධපුරයේ ඉදිකර ඇති ස්තූප වල නිවැරදි අනුපිළිවෙල සඳහන් වන්නේ කවර වරණයේද?
    (1) ථූපාරාමය, මිරිසවැටිය, රුවන්වැලිසෑය, අභයගිරිය, ජේතවනාරාමය
    (2) ථූපාරාමය, රුවන්වැලිසෑය, අභයගිරිය, මිරිසවැටිය, ජේතවනාරාමය
    (3) ථූපාරාමය, මිරිසවැටිය, අභයගිරිය, රුවන්වැලිසෑය, ජේතවනාරාමය
    (4) ථූපාරාමය, අභයගිරිය, මිරිසවැටිය, රුවන්වැලිසෑය, ජේතවනාරාමය
    (5) ථූපාරාමය, ජේතවනාරාමය, මිරිසවැටිය, අභයගිරිය, රුවන්වැලිසෑය (........)

19. බ්‍රිතාන්‍ය පාලන සමය තුළ ක්‍රියාත්මක කරන ලද ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය නිවැරදි අනුපිළිවෙලට අඩංගු වන්නේ පහත සඳහන් කීවෙනි වරණයේ ද?

(1) කෝල්බෲක්, ඩොනමෝර්, මැනිං, මැකලම්, සෝල්බරි

(2) කෝල්බෲක්, මැකලම්, මැනිං, ඩොනමෝර්, සෝල්බරි

(3) මැකලම්, කෝල්බෲක්, මැනිං, සෝල්බරි, ඩොනමෝර්

(4) මැනිං, මැකලම්, කෝල්බෲක්, ඩොනමෝර්, සෝල්බරි

(5) කෝල්බෲක්, මැකලම්, ඩොනමෝර්, මැනිං, සෝල්බරි (........)

20. පහත සඳහන් වැව් ඉදිකරන ලද කාලය අනුව ඒවායේ නිවැරදි අනුපිළිවෙල අඩංගු වන්නේ කවර වරණයේ ද?

(1) තිසාවැව, නච්චදූව වැව, අභය වැව, මින්නේරිය වැව, කලා වැව

(2) අභය වැව, තිසා වැව, මන්නේරිය වැව, නාච්චදූව වැව, කලා වැව

(3) අභය වැව, තිසා වැව, මින්නේරිය වැව, කලා වැව, නච්චදූව වැව

(4) නච්චදූව වැව, අභය වැව, තිසා වැව, කලා වැව, මින්නේරිය වැව

(5) තිසා වැව, අභය වැව, මින්නේරිය වැව, කලා වැව, නාච්චදූව වැව (........)

- **අංක 21 සිට 25 තෙක් වූ සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු 05 බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

21. වට්ටගාමිණී අභය හෙවත් වළගම්බා රජු මුහුණ දුන් අභියෝග

(1) සත් දමිළ ආක්‍රමණය

(2) තීය බමුණාගේ කැරැල්ල

(3) කවිසියගේ මරණින් පසු සෙන්පතීන් රජු හැර යාම

(4) බැමිණිතියා සාය

(5) මාඝගේ ආක්‍රමණය (........)

22. නිශ්ශංකමල්ල රජු

(1) විජාතිකයෙකි.

(2) පළමු පරාක්‍රමබාහු රජු සමඟ පාණ්ඩ්‍ය දේශය ආක්‍රමණය කළේය.

(3) කාලිංග පෙළපතට අයත් බව කීය.

(4) 'තුලාභාර' දාන දුන් බව සඳහන්ය.

(5) නිශ්ශංකමල්ල රජුගේ පුත් වීරබාහු 'මාහ' තනතුර දැරූහ. (........)

23. ශ්‍රී ලංකාවට බුදු දහම හඳුන්වාදීම

(1) තුන්වන ධර්ම සංගායනාව.

(2) සඟමිත් තෙරණියගේ වැඩමවීම.

(3) මහානාග යුවරජු පැවදි වීම.

(4) මිහිඳු හිමිගේ ලංකාගමනය.

(5) මහමෙවුනා උයන සඟසතු කිරීම. (........)

24. පළමුවන පරාක්‍රමබාහු රජුගේ ආගමික කටයුතු

(1) වටදාගේ කරවීම.

(2) ගල්විහාර කතිකාවත පිහිටුවීම.

(3) ආළාහන පිරිවෙන කරවීම.

(4) තුන් නිකාය එක්සත් කරවීම.

(5) අඹගමුව ග්‍රාමය ශ්‍රී පාදස්ථානයට පවරා දීම. (........)

25. පළමුවන පරාක්‍රමබාහු රජුගේ විදේශ සම්බන්ධතා

(1) බුරුම ආක්‍රමණය

(2) දකුණු ඉන්දීය පාණ්ඩ්‍ය දේශ ආක්‍රමණය

(3) කාම්බෝජය සමග මිත්‍ර සම්බන්ධතා.

(4) චීනය සමඟ වෙළඳ සම්බන්ධතා

(5) අග්නිදිග ආසියාතික රටවල් සමඟ ආගමික සබඳතා. (........)

- අංක 26 සිට 30 තෙක් වූ එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති **A, B, C** හා **D** යන ප්‍රතිචාර හතර අතුරෙන් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා

**A** හා **B** පමණක් නිවැරදි නම් ............ (1) ද

**B** හා **C** පමණක් නිවැරදි නම් ............ (2) ද

**C** හා **D** පමණක් නිවැරදි නම් ............ (3) ද

**A** හා **C** පමණක් නිවැරදි නම් ............ (4) ද

ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි නම් ............ (5) ද වරහන් තුළ ලියන්න.

උපදෙස් සම්පිණ්ඩනය

| (1) | (2) | (3) | (4) | (5) |
|---|---|---|---|---|
| **A** සහ **B** පමණක් නිවැරදි ය. | **B** සහ **C** පමණක් නිවැරදි ය. | **C** සහ **D** පමණක් නිවැරදි ය. | **A** සහ **C** පමණක් නිවැරදි ය. | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදි ය. |

26. පණ්ඩුකාභය රජුගේ පාලනය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේද?
   (A) අනුරපුර අගනුවර කිරීම.
   (B) ස්වර්ණපාලි කුමරිය විවාහ කර ගැනීම.
   (C) ග්‍රාම සීමා පිහිටුවීම.
   (D) නුවර වැව ඉදිකිරීම. (........)

27. රජරට ශිෂ්ටාචාරයේ පරිහානිය හා බිඳවැටීම සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේද?
   (A) කාලිංග මාඝගේ ආක්‍රමණයෙන් සිදු වූ විනාශයයි.
   (B) වාරි මාර්ග නඩත්තු කිරීම.
   (C) චන්ද්‍රබානුගේ ආක්‍රමණය.
   (D) යාපනය රාජධානියෙන් එල්ල වූ තර්ජන. (........)

28. පොළොන්නරු යුගයේ දී හින්දු ආගම පැතිරයාම සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?
   (A) ශ්‍රී ලාංකික සංස්කෘතිය සම්බන්ධයෙන් විශාල හින්දු බලපෑමක් දැකිය හැකිය.
   (B) ශිව දේවාල ගොඩනංවනු ලැබීය.
   (C) නිශ්ශංකමල්ල රජතුමා හින්දු ආගමට අනුග්‍රහ දැක්වූ බව ගල්පොත සෙල්ලිපියේ සඳහන් වේ.
   (D) කළ්‍යාණවතී රැජින විසින් කතරගම ස්කන්ධ දේවාලය ඉදිකරනු ලැබීය. (........)

29. ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේද?
   (A) කැබිනට් ක්‍රමය හඳුන්වාදීම (B) සර්වජන ඡන්දබලය පිරිනැමීම
   (C) රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවීම. (D) රාජ්‍ය සේවා කොමිෂම පිහිටුවීම. (........)

30. පළමුවන විජයබාහු රජතුමාගේ කාර්ය සංසිද්ධීන් සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?
   (A) රට එක්සේසත් කිරීම.
   (B) උපසම්පදා විනය කර්මය සිදු කිරීම සහ භික්ෂු ශාසනය යළි පිහිටුවීම.
   (C) කාලිංග මාඝ පරාජය කිරීම.

(D) තිබ්බතය සමඟ ආගමික සම්බන්ධතා පැවැත්වීම (........)

- **අංක 31 සිට 35 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන් තුළ ලියන්න.**

31. මින්නේරිය වැව ඉදිකරවන ලද්දේ කවරකු විසින්ද?
    (1) දෙවන මොග්ගල්ලාන (2) මහසෙන් (3) I අග්බෝ
    (4) පණ්ඩුකාභය (5) වසභ (........)

32. නගර සීමා ලකුණු කොට අනුරාධගාමය ප්‍රධාන අගනුවර බවට පත්කරනු ලැබුවේ කවරකු විසින් ද?
    (1) දේවානම්පියතිස්ස රජු (2) දුටුගැමුණු රජු (3) පණ්ඩුකාභය රජු
    (4) වසභ රජු (5) එළාර රජු (........)

33. එළාර රජුට ආධාර පිණිස පැමිණි දකුණු ඉන්දීය ප්‍රධානියා කවරෙක් ද?
    (1) පුලහත්ථ (2) භල්ලුක (3) දීඝජන්තු
    (4) පනයමාර (5) දාඨික (........)

34. ලංකාවේ රජ පෙළපතේ අවසාන රජතුමා කවරෙක් ද?
    (1) දෙවන රාජසිංහ රජු (2) දෙවන විමලධර්මසූරිය රජු (3) ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු
    (4) කීර්ති ශ්‍රී රාජසිංහ රජු (5) ශ්‍රී වික්‍රම රාජසිංහ රජු (........)

35. කව්සිළුමිණ රචනා කරන ලද්දේ කවුරුන් විසින් ද?
    (1) දෙවන පරාක්‍රමබාහු රජු (2) ධර්මසේන හිමි (3) වෛදේහ හිමි
    (4) වෑත්තෑවේ හිමි (5) අනෝමදස්සී හිමි (........)

- **අංක 36 සිට 40 තෙක් වූ ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4 සහ 5 යන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.**

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| (1) | නිවැරදිය. | වැරදිය. |
| (2) | නිවැරදිය. | නිවැරදිය. |
| (3) | වැරදිය. | වැරදිය. |
| (4) | වැරදිය. | නිවැරදිය. |
| (5) | නිවැරදිය. | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදා දෙයි. |

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය | |
|---|---|---|---|
| 36. | පළමු පරාක්‍රමබාහු රජු විසින් කරවන ලද පරාක්‍රම සමුද්‍රය එතෙක් නිර්මාණය කළ විශාලතම වැවයි. | පළමු පරාක්‍රමබාහු රාජ්‍ය සමය පැරණි ශ්‍රී ලංකාවේ ජල ඉංජිනේරු කාර්ය සාඵල්‍යයේ විශිෂ්ඨත්වය සලකුණු කරයි. | (........) |
| 37. | ලංකාවේ ප්‍රථම සංඝභේදය වළගම්බා රජුකල ඇති විය. | මෙම රජුගේ පාලන සමයේ දී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරන ලදි. | (........) |
| 38. | ශ්‍රී ලංකා ඉතිහාසයේ දැනට ශේෂව පවතින ආදිතම වංශකතාව දීපවංශයයි. | දීපවංශයේ දෙවන කොටස චූලවංශය නමින් හැඳින්වේ. | (........) |
| 39. | පනාකඩුව තඹ සන්නසේ පළමුවන පරාක්‍රමබාහු රජු හා දෙවන පරාක්‍රමබාහු රජතුමා අතර ඇති වූ ගිවිසුම වාර්තා කර ඇත. | පොළොන්නරු යුගයේ සෙල්ලිපි විශාලම සංඛ්‍යාව කර වූ පාලකයා පළමුවන පරාක්‍රමබාහු රජතුමා වේ. | (........) |
| 40. | ගම්පොළ රාජධානියේ ආරම්භකයා හතරවන | යාපනයේ ආර්ය චක්‍රවර්තී ගම්පල රාජධානියට | |

(ල. 01 x 40 =40)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved.



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# ලංකා ඉතිහාසය - II

**13 ශ්‍රේණිය**

**කාලය පැය 02 යි.**

උපදෙස්:-

- **පළමුවන ප්‍රශ්නයටත්, තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.**
  **(ප්‍රශ්න අංක 01 ට පිළිතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකාවේ දළ සිතියමක් සපයා ඇත.)**

---

01. ඔබට සපයා ඇති ශ්‍රී ලංකා සිතියමේ පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කොට නම් කරන්න. ඒවායින් කැමැති දෙකක් පිළිබඳව කෙටි ඓතිහාසික සටහන් ලියන්න.

(i) වලවේ ගඟ (ii) මඩකලපුව (iii) අට දහස් රට
(iv) යාපනය (v) පොළොන්නරුව (vi) දඹකොළ පටුන
(vii) ගෝකණ්ණ (viii) දීඝවාපිය

(නිවැරදිව ලකුණු කිරීටම හා නම් කිරීමට ලකුණු 01 බැගිනි.
කෙටි ඓතිහාසික සටහනකට ලකුණු 05 බැගිනි. මුළු ලකුණු = 18)

02. (i) ශ්‍රී ලංකාවේ ඉතිහාසය කෙරෙහි භූගෝලීය ලක්ෂණ බලපා ඇත. බාහිර හා අභ්‍යන්තර ලක්ෂණ දෙක බැගින් ලියන්න.

(ii) අනුරපුර යුගයේ අවසානය දක්වා මෙම ලක්ෂණ ලංකා ඉතිහාසය කෙරෙහි බලපෑ ආකාරය විස්තර කරන්න. (ල. 14)

03. දුටුගැමුණු රජතුමාගේ දේශපාලන, ආගමික කාර්ය සංසිද්ධිය අගයන්න. (ල. 14)

04. පරාක්‍රමබාහු රජතුමාගේ රාජ්‍ය පාලන සමය පොළොන්නරු යුගයේ ස්වර්ණමය කාලයයි. පහත සඳහන් කරුණු යටතේ ඔහුගේ කාර්ය භාරය විස්තර කරන්න.

(i) රජුගේ දේශීය ප්‍රතිපත්ති

(ii) වාරිමාර්ග ඉදිකිරීම් හා දේශපාලන ප්‍රතිසංස්කරණ (ල. 14)

05. පළමුවන විජයබාහු රජු පොළොන්නරු යුගයේ සිටි ශ්‍රේෂ්ඨ පාලකයෙකි. පහත සඳහන් මාතෘකා ඇසුරින් මෙම කියමන සාකච්ඡා කරන්න.

(i) විදේශ ආධිපත්‍යයෙන් රට බේරාගැනීම හා රට එක්සේසත් කිරීම

(ii) ඔහුගේ ශාසනික කටයුතු (ල. 14)

(01) ප්‍රශ්නයට අදාළ ශ්‍රී ලංකා ආකෘති සිතියම

